www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# කොළඹ තවත් බොහෝ පවුල් එළවා දැමීමට සැලසුම් කරයි

## More Colombo families targetted for eviction

ඩබ්ලිව්. ඒ. සුනිල් සහ ශ්‍රී හරන්

2010 ජූනි 07



උතුරු කොළඹ ග්‍රෑන්ඩ් පාස් ඇළ ඉවුර යාබදව දිවිගෙවන පැල්පත් වැසියන් වෙත මැයි 31 වෙනි දින ආන්ඩුවේ නිලධාරීන් කියා සිටියේ ඇළ ඉවුරේ සිට මීටර් හය හමාරක් තුළ පිහිටි සියලුම ඉදිකිරීම් ඉවත් කරන බවයි. ඉඩම් ප්‍රතිසංස්කරන හා සංවර්ධන මන්ඩලයේ මුද්‍රාව සහිත ටෝකන් පතක් නිවැසියන් වෙත ලබා දී තිබේ.

නියත ලෙසම මෙම පවුල් සිත් තැවුලටත් දැඩි කෝපයටත් පත්ව සිටිති. ඔවුන් ඔවුන්ගේ නිවෙස්වලින් කොතැනට කවදා පිටමං කරනු ඇත්දැයි ඔවුන්ට දන්වා නැත. නිලධාරීන් කැටුව පැමිනෙන පොලිසිය හා සොල්දාදුවන් නිසා නිවාස කඩා දැමීම පිලිබඳ භීතිය උත්සන්න කෙරෙයි. නිවාස 50 ක් පවුල් 160ක් පමන අනාත වීමට නියමිතය.

මැයි මස මැදභාගයේ ගංවතුර උවදුරින් පසු නගරයේ ඇලඉවුරු දෙපසින් පැල්පත් නිවාස ඉවත් කරන ලෙස ජනාධිපති මහින්ද රාජපක්ෂ බලධාරීන්ට නියෝග කලේය. මෙම මෙහෙයුම් ආරක්ෂක අමාත්‍යාංශය සමග ඒකාබද්ධව සිදු කරනු ඇති බව වාරිමාර්ග අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා නිවේදනය කලේය. කෙසේවෙතත්, ගංවතුර ගැලීම පැල්පත් ඉවත් කිරීමේ පලල් සැලසුම ඉදිරියට දැමීමට යොදා ගන්නා බොරු හේතුවක් පමනි. (බලන්න: ශ්‍රී ලංකා ආන්ඩුව පැල්පත් ඉවත් කිරීමේ මෙහෙයුම් පුලුල් කරයි)

ග්‍රෑන්ඩ් පාස් ඇළ යාබද ප්‍රදේශය පහත් බිමක් වන අතර සාමාන්‍යයෙන් සෑම වසරක දී ම ගංවතුරට යට වේ. මෙම ඇළ නිසියාකාරව ඉදිකර නොමැති අතර ඉඩම් ප්‍රතිසංස්කරන මන්ඩලයට එය පෙනී ඇත්තේ මේ දැන්ය. නගරසභා බලධාරීන් සහ ගොඩකිරීමේ මන්ඩලය අතීතයේදී තමන් කෙරෙහි කිසිදු සැලකිල්ලක් නොදැක්වූ බව පදිංචිකරුවෝ ලෝක සමාජවාදී වෙබ් අඩවියට කීහ. පසුගිය මාසයේ ගංවතුර ගැලූ අවස්ථාවේදී වතුර මට්ටම මීටරයක් උසට නැගුනේය. පදිංචිකරුවෝ දින හතරක් තිස්සේ පලාතේ පන්සල්වල හා විදුහල්වල ලැගුම් ගෙන සිටියහ.



ප්‍රදේශයේ පදිංචිකරුවෝ ලෝසවෙඅ වාර්තාකරුවන් වෙත අදහස් පලකරමින්

පලාත් වැසියන් ආන්ඩුවේ දෙපිටකාට්ටුකම පිලිබඳව සඳහන් කලෝය. ඔවුන්ගේ නිවෙස් ඇළට ඉතාමත් ආසන්න යැයි කියන අතරේ අනෙක් ඉවුරේ මීටර් 6.5 සීමාව තුළ පෞද්ගලික සමාගමක ගොඩනැගිලි පිහිටා තිබේ. එය ඉවත් කර ගන්නා ලෙස

තවමත් දැන්වීම් යවා නැත.



**ග්‍රෑන්ඩ් පාස් ඇල අද්දර ළමුන් කන්ඩායමක්**

ප්‍රදේශය 'ස්ටේඩියම් ගම' යනුවෙන් හඳුන්වයි. 1983 දී එය පිහිටුවනු ලැබුනේ රටේ විශාලතම ගෘහස්ථ ක්‍රීඩාංගනය වන සුගතදාස ක්‍රීඩාංගනය ගොඩනැගීමට එකල එක්සත් ජාතික පක්ෂය විසින් පැල්පත් කඩා ඉවත් කිරීමෙන් අනතුරුවය. ඉවත්කල ජනයා තාවකාලික ලෑලි මඩුවලට යැවුනු අතර පසුව ඔවුන්ට වඩා ස්ථිර නිවාස සැපයීය. මුලු සංඛ්‍යාව 243කි. එහෙත් පවුල් ව්‍යාප්ත වෙත්ම හා තව තව මිනිසුන් ප්‍රදේශයට සංක්‍රමනය වීමේදී ඇලට සමීපව ඔවුහු ගෙවල් තනා ගත්හ.

ජනාවාස පෙදෙසට හොඳ පාරවල් හෝ අතුරු මාවත් නැත. මඩ වලවල් සෑම තැනම දක්නට ලැබේ. නිවෙස් අතර පරතරය මීටරයක් පමන ය. මදුරුවන් සඳහා පෝෂක ප්‍රදේශයක් වෙමින් විවෘත කානු තුලින් කුනු වතුර ගලා ගෙන යයි. බොහෝ නිවෙස්වල පවුල් කීපයක් ජීවත් වෙති. නිවෙස් සිමෙන්ති ගල් වලින් තනා ඇති අතර වහලවල්වලට ටකරන් තහඩු ආවරනය කර තිබේ. ඇතැම් නිවසකට කුඩා නිදන කාමරයක්, කුස්සියක් හා වැසිකිලියක් තිබෙන නමුත් බොහෝමයක් ඉතා කුඩා ප්‍රමානයේ ඒවාය.

ඔවුන් ස්ටේඩියම් ගමට මාරුකර එවීමේදී නිවැසියන් වෙත නීතිමය ලියකියවිලි ලබා දෙන බව කීහ. නගර සභාවට වරිපනම් සඳහා රුපියල් 50ක් ඔවුන් ගෙවන නමුත් වසර 27කට පසුත්, ඔවුන්ට කිසිදු ලේඛනයක් ලැබී නැත.

නිකොලස්, 1983 එලෙස මෙහි පදිංචියට පැමිනි අයගෙන් කෙනෙකි. ඔහුට හොඳ නිවසක් සතුව තිබූ නමුත් එයින් ඉවත් වීමට බල කෙරින. "දැන් අපි හැම අවුරුද්දෙම ගංවතුරට යටවෙනවා," ඔහු කීවේය. "ගෙදරට වන්දි විදියට මට රුපියල් 60,000කුයි ඉඩමකුයි ලැබුනා, ඒත් ඒක ප්‍රමානවත් මදි. මේ හතරැස් ගෙවල් හදලා තියෙන්නේ පර්චස් දෙකක (වර්ග මීටර් 50ක) බිම් කෑල්ලක. අපිට වතුර ලැබුනෙත් ටික කාලයකට පස්සෙ. ආන්ඩුව අපිට ගෙවල් දුන්නත් ලයිටුයි වතුරයි ගන්න ගෙවන්න සිද්ධ වුනා."

ඔහුගේ බිරිඳ හිල්ඩා මෙලෙස විස්තර කලාය: "අපි මෙහෙට එනකොට අපේ ළමයි පුංචියි. මට ළමයි පස් දෙනෙක් ඉන්නවා. දැන් ළමයි ලොකු වෙලා කසාදත් බැඳලා. මගේ ළමයි තුන් දෙනෙක් අපේ ගෙදර ඉස්සරහින්ම පොඩි ගෙවල් හදලා තියෙනවා. මේ වගේ හුඟක් පවුල් ඉන්නවා. මිනිස්සුන්ට ජීවත් වෙන්න තැන් තියෙන්න ඕන.

"ඒ දවස්වල මගේ සැමියා වැඩ කලේ වරායේ, ඒත් ළමයි පස් දෙනා හදාවඩාගන්න ඒක ප්‍රමානවත් වුනේ නහැ. කීයක් හරි හොයා ගන්න පුලුවන් පුංචි කඩ කෑල්ලක් මට තිබුනා. පස්සෙ මම පිටරට ගියා. හුගාක් ගෑනු අය ගෘහ සේවිකාවො විදියට රට ගියා. ඒක අපට උදව්වක් වුනා. දැන් මම සතියකට දින තුනක් පත්තර කන්තෝරුවක වැඩ කරනවා. මගේ ළමයි මට උදව් කරනවා, ඒත් සල්ලි කීයක් හරි මගේ අතේ තියෙන්න ඕන.

''අපි හිතුවා යුද්දෙන් පස්සේ යම් සහනයක් අපට ලැබෙයි කියලා. දැන් අපි වයසට ගිහින්. මගේ වයස 61යි. මගේ සැමියට 67ක්. ආන්ඩුව මිල ගනන් අඩු කරලා මිනිස්සුන්ට සහනයක් දෙන්න ඕන. දොස්තර මහත්තුරු අපට කියනවා පෝෂ්‍යජනක කෑම කන්න කියලා. එත් අපි කොහොමද ඒක කරන්නේ ?"

ශ්‍රී ලංකාව නව ආසියානු ආශ්චර්ය බවට පරිවර්තනය කරන බවට ජනවාරි මස ජනාධිපතිවරනයේ දී ජනාධිපති රාජපක්ෂ විසින් කරන ලද ප්‍රකාශය පිලිබඳව හිල්ඩා කෝපයෙන් කතා කලාය. "රට ආශ්චර්යක් කරන්න ඉස්සෙල්ලා මිනිස්සු බඩගින්නේ ඉන්න එක නතර කරන්න ඕන. ආශ්චර්ය කරන්න යන්නේ කොලඹින් මිනිස්සු එලවලා දාලද? ඔවුන්ට අපේ ඡන්දය ඕන. හැබයි ඡන්දයෙන් පස්සේ අපි කිසි වැඩකට නැති මිනිස්සු!"

කොම්පඤ්ඤ වීදියෙන් පවුල් නෙරපා දැමීමේදී ඇති වූ නොසන්සුන්තාව ගැන හිල්ඩා සඳහන් කලාය. එමෙන්ම ඇය පසුගිය මැයි මාසයේ දී යුද්ධය නිමවූ පසු තවමත් රඳවාගෙන සිටින 60,000ක් දෙමල වැසියන්ගේ කාරනාව පිලිබඳව ද සඳහන් කලාය. "ඒක හරිම කනගාටුවට කාරනයක්," ඇය කීවාය. "නිලධාරීන් ඇල බලන්න එද්දී පවා හමුදාවයි පොලිසියයි එක්ක එනවා. ඒ අපට අනතුරු අඟවන්ටද?!"

තවත් කාන්තාවක් මෙලෙස විස්තර කලාය: "අපේ පවුලේ දහතුන් දෙනෙක් ඉන්නවා. මට ලමයි හතර දෙනෙක් ඉන්නවා, ඒ අයගෙන් දෙන්නෙක් විවාහ වෙලා. ඒ ඔක්කොම ඉන්නේ අපිත් එක්ක. අපේ ගෙවල් කඩනවානම්, විකල්ප තැනක් අපට ලැබෙනවද නැද්ද කියලා ආන්ඩුව අපට කියලා නෑ. එදිනෙදා ජීවිකාව හොයා ගන්න අපට ඉඩමක් මිලදී ගන්ටවත් ගෙයක් කුලියට වත් පුලුවන්කමක් නැහැ."

විවාහ වී දරුවන් දෙදෙනෙකු ද සිටින රොමේෂ් මෙසේ කීවේය: "මගේ දෙමව්පියන්ට 1983 දී ස්ටේඩියම් ගමේ ගෙයක් ලැබුනා. මම කසාද බැන්දට පස්සේ ඒ ගෙදර ඉඩ මදි වුනා, ඉතිං මම මෙතන පදිංචිවුනා. මේ වෙනකොට මම මෙතැන පදිංචි වෙලා අවුරුදු දහයකට වැඩියි. ඔවුන් සැලසුම් කරල තියෙන විදියට ගොඩනැගිලි කඩලා දැම්මොත් කුස්සියත් එක්ක මගේ ගෙදරින් භාගයක් නැති වේවි. අපි දන්නේ නහැ අපේ මුලුගෙදරම කඩලා දාන්න ඔවුන් සැලසුම් කරල තියෙනවාද කියලා.

"මම වැඩ කරන්නේ කොලඹ පෞද්ගලික ආයතනයක. සියලුම දීමනාවලුත් එක්ක මට මාසයකට ලැබෙන්නේ රුපියල් 15,000කට අඩු වැටුපක්. මගේ බිරිඳට රක්ෂාවක් නැහැ. අද තියෙන ජීවන වියදමත් එක්ක  ඒ වගේ පඩියකින් පිරිමහ ගන්න බැහැ. ආහාරවල වියදමට අපිට සතියකට රුපියල් 3,000ක් පමන අවශ්‍යයි. පොල් ගෙඩියක් රුපියල් 35යි. අපි ගෑස් එකකට මාස් පතා රුපියල් 1,700ක් වියදම් කරන්න ඕන.

"දැන් තියෙන ආන්ඩුවට මම සහයෝගය දුන්නා. ඒත් ඒ අය මිනිස්සුන්ට විරුද්ධව බොහෝ දේවල් කරනවා. යුද්ධයෙන් පසුව මිනිස්සුන්ට සහනයක් දෙන්න ඔවුන් පොරොන්දු උනා. ඔවුන් යුද්ධය දිනුවා දැන් හමුදාව මෙහෙට යොදාගෙන මිනිස්සු මර්දනය කරන්න උත්සාහ කරනවා."

© www.wsws.org